**තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**

------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 24 දිනද , ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 17 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර්15 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

## 1.2 අහිතකර මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ශුද්ධ වත්කම් වල අඩුවීම

2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් වල වටිනාකම රු. 128,413,548 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් වල වටිනාකම රු. 118,900,500 ක් විය. ඒ අනුව ශුද්ධ වත්කම්වල අඩුවීම රු. 9,513,048 ක් විය.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවට අයත් ගල් ක්‍රෂරය බදුදීම වෙනුවෙන් 2013 සැප්තැම්බර් 26 දින සිට දෙසැම්බර් 26 දින දක්වා කාලයට අදාලව බදුකරුගෙන් ලැබිය යුතු රු. 203,280 ක බදු මුදලක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබූ කර්මාන්ත වලට අදාලව ලැබී තිබූ එකතුව රු. 37,857,420 ක ප්‍රාග්ධන ආදායම් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස 3/81 ආදායම් විෂයට බැරකර තිබුණි.

(ඇ) විවිධ තැන්පතු වලට අදාල ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත නොවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුමේ රු. 478,883ක හර ශේෂයක් විය.

(ඈ) 2012 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද කර්මාන්ත වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කරන ලද එකතුව රු. 40,128,852 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ලෙස 309 වැය විෂයයට හරකර තිබුණි.

(ඉ) උසාවි දඩ හා මුද්දර ගාස්තු ගිණුම් තැබීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාස වලට අදාලව ලැබිය යුතු රු. 226,585 ක ආදායම් ගිණුම් ගතකර නොතිබුණි.

ii. වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු. 5,223,285 ක් වුවද ගිණුම්ගත කර තිබුණේ රු. 2,425,230 ක් පමණි.

iii. සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ 2009 හා 2012 වර්ෂ වලට අදාල උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායමින් රු. 97,347 ක් වර්ෂයේ ආදායමට ගිණුම්ගත කර තිබුණි.

(ඊ) රු. 5,280,565 ක් වටිනා ස්ථාවර වත්කම් විෂයයන් 10 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(උ) රු. 625,000 ක් වූ අංක 53-5719 ද්විත්ව කාර් රථය වෙනුවට අංක 56-1099 කැබ්රථය හුවමාරු කරගෙන තිබුණ නමුත් ද්විත්ව කාර් රථයේ වටිනාකම ගිණුම් වලින් ඉවත්කර නොතිබුණි.

(ඌ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ ඉදිකිරීම් වෙනුවෙන් වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ රු. 1,830,999 ක මුදලක් හා වර්ෂය අවසානයට ගෙවිය යුතුව තිබූ රු. 2,223,818 ක මුදලක් ගිණුම්ගත කිරීමට ක්‍රියාකර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාල එකතුව රු. 539,970 ක ආදායම් වර්ෂයේ ආදායමට ගෙන නොතිබුණි.

(ඒ) 2013 වර්ෂයට අදාලව 2014 වර්ෂයේදී ගෙවන ලද රු. 142,714ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදමින් හා ණය හිමියන්ගෙන් අත්හැරී තිබුණි.

(ඔ) ස්ථාවර තැන්පත් ගිණුම් 03 ක් වෙනුවෙන් වර්ෂය අවසානයට ලැබිය යුතු රු. 224,752 ක පොළී ආදායම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඕ) 2013 දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය හා පොළිය රු. 7,552,339 ක් ගිණුම් වලට ගැලපීම සිදුකර නොතිබුණි.

### 1.3.3 අසම්භාව්‍ය බැරකම්

--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් වල වටිනාකම රු. 3,377,513 ක් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

### 1.3.4 නොසැසඳූ පාලන ගිණුම්

--------------------------

ගිණුම් විෂයයන් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම් සහ උපයෝගී ලේඛන අනුව වටිනාකම් අතර රු. 180,865 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.5 ගෙවිය යුතු ගිණුම්

-------------------

ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය යටතේ නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය මගින් ප්‍රාදේශීය සභාව වෙත දෙමහල් සාප්පු සංකීර්ණය හා මාර්ග ඉදිකිරීම සඳහා ලබාදෙන ලද ණය මුදල් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ආපසු ගෙවීමට කටයුතු කර නොතිබුණි. පොළී මුදල් ගෙවීම් 2005 සැප්තැම්බර් ද වාරික ගෙවීම 2007 සැප්තැම්බර් මසද ආරම්භ කර 2012 දෙසැම්බර් 31 දිනට ණය හා පොළිය ගෙවා අවසන් කළයුතු වුවත් කිසිදු පොළී මුදලක් හෝ ණය වාරික මුදලක් ගෙවීමට කටයුතු කර නොතිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට පොලිය රු. 28,439,716 ක් වූ අතර වාරික මුදල රු. 21,352,693 ක් විය. ඒ අනුව ගෙවිය යුතු මුළු මුදල රු. 49,792,409 ක් විය.

**1.3.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

එකතුව රු. 57,970,426ක් වූ ගනුදෙනු සම්බන්ධයෙන් අවශ්‍ය උපලේඛන,යාවත්කාලීන කරන ලද ලේඛන හා ශේෂ සහතික යනාදි තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 55,220 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 5,615,095 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් , තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000' | රු. 000' | රු. 000' |
| i. | වරිපනම් හා බදු | 1,955 | 2,357 | 3,543 |
| ii. | බදුකුලී | 7,014 | 7,538 | 1,142 |
| iii. | බලපත්‍ර ගාස්තු | 16,050 | 8,513 | 183 |
| iv. | වෙනත් ආදායම් | 48,586 | 33,380 | 3,015 |

**2.2.2 වරිපනම් හා බදු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු රු. 3,567,629 ක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 33 ප්‍රකාර වරිපනම් බදු ගෙවීම පැහැර හරින ලද පුද්ගලයින් පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) දීර්ඝකාලීනව වරිපනම් බදු ගෙවීම පැහැර හරින ලද බදුකරුවන් 13 දෙනෙකු ගෙන් අයවිය යුතු රු. 369,486 ක හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 (1) (අ) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.2.3 පන්නේගමුව සතිපොළ**

**------------------------**

2012 වර්ෂය සඳහා අයවිය යුතු හිඟ මුදල රු. 51,870 ක්වූ අතර එම මුදල නොගෙවා තිබියදී 2013 වර්ෂය සඳහා එම බදුකරුටම සතිපොළ බදුදී තිබූ අතර 2013 වර්ෂයට අදාලව හිඟ බදු මුදල රු.59,190 ක් විය.

**2.2.4 කඩකුලී**

**---------**

ප්‍රාදේශීය සභාවට අයත් කඩකාමර වලින් 2013 දෙසැම්බර් 31 දිනට හිඟ කඩකාමර කුලී මුදල් රු. 1,142,895 ක් වූ අතර හිඟ කුලී මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

ස්ථාන 04 ක පිහිටි කඩකාමර 32 ක බදුකරුවන් විසින් ව්‍යාපාරික කටයුතු සිදු නොකරන බව ආදායම් පරිපාලකවරයා විසින් වාර්තාකර තිබුණෙන් සභා තීරණ මත මාසික බිල් කිරීම නතර කර තිබුණි. විගණන දිනය වූ 2013 දෙසැම්බර් 06 දිනට රු. 385,527 ක හිඟ මුදල් අයකර ගැනීම කටයුතු කර නොතිබුණි.

**2.2.5 බලපත්‍ර ගාස්තු**

**---------------**

සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු බලපත්‍ර ගාස්තු ආදායම රු. 179,397 ක් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 (7) වගන්තිය ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

**-----------------------------**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 2,792,293 ක මුදලක් උසාවි දඩ සහ මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

ප්‍රාදේශීය සභාව මගින් සමාලෝචිත වර්ෂය තුල පෙර පාසල් ගුරුවරියන් 05 ක්ද, වැල්ඩින්කරුවෙකු ද පත්කර 2014 ඔක්තෝබර්31 දිනට වැටුප් හා දීමනා සේවක භාරකාර හා සේවක අර්ථ සාධක අරමුදල් ලෙස එකතුව රු. 410,604 ක මුදලක් ගෙවා තිබුණි.

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. මෙම පත්වීම් සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1) (1) වගන්තිය ප්‍රකාර පළාත් පාලන කොමසාරිස්වරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය ලැබී නොතිබුණි.

ii. විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල්ගේ 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 4.1 ඡේදය අනුව රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් පත්වීම් ලබාදිය යුතු වුවත් එයට පටහැනිව පෙර පාසල් ගුරු පත්වීම සඳහා සේවක අර්ථසාධක අරමුදල් පත්වීම් ලබාදී තිබුණි.

iii. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2010 ජුලි 30 දිනැති අංක DMS/D3/97/27/02 දරන චක්‍රලේඛය මගින් පෙර පාසල් පාලිකා තනතුර ඇති නොකිරීමට සහ දැනට සේවයේ යෙදී සිටින පාලිකාවන් විශ්‍රාම යාමෙන් අනතුරුව එම තනතුර අහෝසි කිරීමට ප්‍රතිපත්තිමය තීරණයකට එළඹ ඇති බව දක්වා තිබුණද එකී විධිවිධානයට පටහැනිව කටයුතු කර තිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**3.2.1 අනුකූලතා සහතික නිකුත් නොකිරීම**

1986 මාර්තු 10 දිනැති අංක 392/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පලකරනු ලැබූ 1986 නාගරික සංවර්ධන අධිකාරිය (සැලසුම් හා ගොඩනැගිලි) නියෝග අංක 07 හි සඳහන් පරිදි සභාව විසින් ඉදිකිරීම් කටයුතු අනුමත කල ගොඩනැගිලි සැලසුම් වෙනුවෙන් ඉදිකිරීම් කටයුතු නිම කිරීමෙන් පසුව අධීක්ෂණ කටයුතු සිදුකර අනුකූලතා සහතික නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. 2011 සිට 2013 නොවැම්බර් දක්වා ගොඩනැගිලි සැලසුම් 218 ක් අනුමත කර තිබු අතර එයින් සැලසුම් 02 ක් සඳහා පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබුණි.

3.2.2 අවිධිමත් ගනුදෙනු

(අ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 177 ප්‍රකාරව මිළ ගණන් කැඳවිමකින් තොරව සභාව විසින් අවස්ථා 10 කදී රු. 423,920 ක මිළදී ගැනීම් සිදුකර තිබුණි.

**(ආ)** 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 වගන්තිය අනුව රු. 250,000 ට අඩු මිළදී ගැනීම් සඳහා අවම වශයෙන් මිළ ගණන් 03 ක්ද රු. 250,000 ට වැඩි මිළදී ගැනීම් සඳහා අවම වශයෙන් මිළ ගණන් 05 ක්ද ලබාගත යුතු වුවත් අවස්ථා 09 කදී එකතුව රු. 2,486,175 ක මිළදී ගැනීම් වෙනුවෙන් එසේ කටයුතු කර නොතිබුණි.

**3.2.3. ජල බවුසරය අලුත්වැඩියා කිරිම**

අංක 227-5807 ජල බවුසරය අලුත්වැඩියා කිරිම වෙනුවෙන් 2013 ජනවාරි 09 දින රු. 697,025 ක්ද 2013 පෙබරවාරි 01 දින රු. 233,775 ක්ද ලෙස එකතුව රු. 930,800 ක මුදලක් පුද්ගලික ආයතනයකට ගෙවා තිබුණි. පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. ඇස්තමේන්තුවක් සකස් කර නොතිබූ අතර අලුත්වැඩියාව සිදුකළ ආයතනය සමඟ ගිවිසුමක් අත්සන් කර නොතිබුණි.

ii. අලුත්වැඩියාව සිදුකරනු ලැබූ ආයතනය වෙතින් 2012 ජුලි 01 දිනැතිව මිළ ගණන් ලබාදී තිබියදී අලුත්වැඩියා කිරීම් අතරතුර අත්‍යවශ්‍ය මට්ටමේ පැවති අලුත්වැඩියා කිරීම් සඳහා මිළ ගණන් ඉදිරිපත් කිරීම" ලෙස දක්වමින් රු. 233,775 ක අමතර මිළ ගණන් 2012 ජුනි 20 දිනැතිව ඉහත ආයතනයෙන්ම එවා තිබුණි. මේ අනුව ජල බවුසරය අළුත්වැඩියාව වෙනුවෙන් 2012 ජුලි 01 දින මිල ගණන් ලබාදී තිබුණද ඊට පෙරම එම අළුත්වැඩියාව සිදුකර ඇති බවත් මිළ ගණන් කැඳවීම් පසුව කර ඇති බවත් පැහැදිලි විය.

**3.2.4 අත්තිකාරම්**

2013 දෙසැම්බර් 31 දින වන විට රු. 168,649 ක අත්තිකාරම් මුදල් පියවා නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පහත සඳහන් වත්කම් දීර්ඝ කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින අතර එම වත්කම් ප්‍රයෝජනයට ගැනීමට හෝ 2003 ජනවාරි 03 දිනැති අංක 353 (5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

i. අංක 37 – 6092 ට්‍රැක්ටරය
ii. රෙදි මහන උපකරණ
iii. මෝටර් බෝට්ටු දෙක
iv. ශාරීරික ව්‍යායාම් උපකරණ
v. අන්තර් සම්බන්ධිත කුට්ටිගල් නිෂ්පාදන යන්ත්‍රය

(ii) සභාව විසින් රු. 407,529 ක මුදලක් වැයකර 2004 වර්ෂයේදි ඉදිකර තිබූ කිරින්ද ගොඩාන තොරතුරු මධ්‍යස්ථානය එම කාර්යය සඳහා යොදා නොගන්නා බව 2013 දෙසැම්බර් 06 දින කරන ලද ක්ෂේත්‍ර පරික්ෂාවේදි නිරීක්ෂණය විය.

**(iii)** ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් සභාව වෙත ලැබී තිබූ අඟුලක් කටුවන ප්‍රාදේශීය සභාව වෙත ලබාදී ඇති බව දක්වා තිබූ අතර එම අඟුල නැවත ලබාගැනීමට 2014 ජුනි 11 දින වන විටත් ක්‍රියාකර නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඇ) සේවක ණය පරිපාලනය